# සීමාසහිත ලංකා පොහොර සමාගම

## කෘෂිකර්ම අමාත්‍යාංශය

## පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

වසර 50 ක ඉතිහාසයක් ඇති සී/ස ලංකා පොහොර සමාගම කෘෂිකර්ම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින පූර්ණ රජය සතු සමාගමකි. අප සමාගම රසායනික පොහොර ආනයනය, ගුණාත්මක මිශ්‍ර පොහොර නිෂ්පාදනය, අලෙවි කිරීම හා බෙදාහැරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආයතනයක් සතු විශාලතම බෙදාහැරීම් ජාලයක් හිමි රජයේ ප්‍රමුඛතම ආයතනය වේ.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ මධ්‍ය මට්ටමේ කළමනාකාර සේවා ගණයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරාලන ගතික ප්‍රතිඵල කඩිනමින් ළඟාකර ගත හැකි බාහිර/අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රාදේශීය අලෙවි කළමනාකරු II ශ්‍රේණිය තනතුර (MM 1.2)

**රැකියා විස්තරය**

- ප්‍රාදේශීය කලාපය තුළ සමාගමේ සමස්ත අලෙවි ඉලක්කය සහ ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ස්වකීය කාර්ය මණ්ඩලය කළමනාකරණය හා මෙහෙයවීම.
- ප්‍රාදේශීය කලාපය තුළ අලෙවිකරණ උපායමාර්ග සැලසුම්කරණය සහ අදාළ බල ප්‍රදේශයේ විකුණුම් ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- ප්‍රාදේශීය කලාපය තුළ ලක් පොහොර අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා යෝග්‍ය රැස්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, වැඩමුළු සංවිධානය කිරීම හා සංවිධානය කරන ලද එවැනි වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගි වී ඒ සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලයේ අලෙවි කළමනාකරු වෙත යොමු කිරීම.
- ප්‍රදේශයේ සියලු රාජ්‍ය ආයතන සමඟ සුහද සම්බන්ධතා පවත්වා ගැනීම මගින් ආයතනික අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කිරීම.
- ප්‍රාදේශීය කලාපය තුළ සියලුම ගබඩාවන්හි පරිපාලන/ අලෙවි/ බෙදාහැරීම් / මෙහෙයුම් කටයුතු සහ අදාළ පොහොර ගබඩාකරණය පිළිබඳ ක්‍රමවත්ව හා වෘත්තිමය ලෙස කටයුතු කිරීම.
- අදාළ බලප්‍රදේශය තුළ බෙදාහැරීමේ හා බලයලත් අලෙවි නියෝජිතයන් හා සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්:**

- විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අලෙවිකරණය/ කළමනාකරණ/ වාණිජවේදී / කෘෂිකර්ම උපාධිය ලබා තිබීම සමග උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු අලෙවි ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද **හෝ**
- වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM) පාඨමාලාව සම්පූර්ණ කර තිබීම සමග අලෙවි ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද.
- ඉංග්‍රීසි භාෂා භාවිතය හා පරිගණක දැනුම පිළිබඳ මනා නිපුණත්වයක් තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ සුදුසුකම් :**

- සීමාසහිත ලංකා පොහොර සමාගමේ අලෙවි ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාරී සේවා ගණයේ I ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

  ඉහත තනතුරු සඳහා වැටුප් පරිමාණය (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/ 2016 අනුව) :

  රු 54,550/= 1,375/=x 10+1,910/=x 15= රු. 96,950/=

**වයස් සීමාව :**

අවුරුදු 24 නොඅඩු – 35 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත)

**වෙනත් :**

**සෑම ඉල්ලුම්කරුවකුම**

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා පෞරුෂත්වයකින් හෙබි ක්‍රියාශීලී පුද්ගලයකු විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**ඉහත තනතුර සඳහා වැටුපට අමතරව පහත සඳහන් වාර ප්‍රසාද හිමි වේ,**

- රජයේ අනුමත දීමනාවන්.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සමාගම විසින් 15% දායකත්වයක් ලබා දෙන අතර, සේවක භවතාගේ දායකත්වය 10% කි.
- සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල ( ETF) සඳහා සමාගම විසින් සේවක භවතාගේ වැටුපෙන් 3% ක දායකත්වයක් දරනු ලබයි.
- සේව්‍ය හා සේවක දෙපාර්ශවයේ දායකත්වයෙන් සේවක භවතා හා පවුලේ සාමාජිකයන් ඇතුළත් වන පරිදි වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමයේ දායකත්වය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත වෙනත් දීමනා (ප්‍රවාහන දීමනාව)
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකරව වෘත්තීය දීමනාවක් හිමිවේ.
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2/2015 අනුව දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම

**අයදුම්පත් යොමු කිරීම :**

ඉහත සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් විසින් එකී සුදුසුකම් සඳහන් කර අයදුම්පතක් 2021.03.31 දිනට පෙර මා වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමි.

- බාහිර අයදුම්කරුවන් ජීව දත්ත තොරතුරු ඇතුළත්ව නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමග 2021.03.31 දින හෝ දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **(ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර)** අප වෙත ලැබීමට සැළැස්විය යුතු අතර, දැනට රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, රජය සතු සමාගම්වල සේවයේ නියුතු සේවක භවතුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මගින් යොමු කළ යුතුය.

**අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය:**

**සභාපති, සී/ස ලංකා පොහොර සමාගම,**
**ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, වත්තල.**

- ඉහත පරිදි යොමු කරනු ලබන අයදුම්පත් හා සහතිකවල පිටපත් Chairman@lakpohora.lk යන ඊමේල් ලිපිනය වෙතද යොමු කළ යුතු අතර, ඊ මේල් යොමු කිරීමේදී Subject තීරුවෙහි ඔබ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.